[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

# දෙවන වාර ඇගයීම - 2023

| | | | |
|---|---|---|---|
| 7 ශ්‍රේණිය | බුද්ධ ධර්මය | පත්‍රය I/II | පැය - 2 යි. |

නම ..................................................................................

සැලකිය යුතුයි;

- **ප්‍රශ්න අංක 1 සිට 20 දක්වා සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **ලැබෙන මුළු ලකුණු සංඛ්‍යාව 40කි.**

## I - පත්‍රය

- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1) බුදුරජාණන් වහන්සේ කළගුණ දැක්වීම වශයෙන් අනිමිස ලෝචන පූජාව සිදුකරන ලද්දේ කී වන සතියේදී ද ?
   i. පළමුවන සතියේ දී ය.
   ii. දෙවන සතියේ දී ය.
   iii. තෙවන සතියේ දී ය .
   iv. පස්වන සතියේ දී ය.

2) පෙර භවයක අකුසල කර්මයක් හේතුවෙන් මුලු ශරීරයේම කුෂ්ඨ වැළදීමෙන් දුකට පත් ව බුදු රජාණන් වහන්සේගෙන් පිහිට ලැබූ භික්ෂූන් වහන්සේ නමකි.
   i. ආනන්ද හිමි.
   ii. සැරියුත් හිමි.
   iii. මහා කාශ්‍යප හිමි
   iv. පූතිගත්ත තිස්ස හිමි.

3) බුද්ධ රත්නය වන්දනා කරන ගාථාව වන්නේ,
   i. ඉතිපිසෝ පාඨය ය.
   ii. ස්වාක්ඛාතෝ පාඨය ය.
   iii. සුපටිපන්නෝ පාඨය ය.
   iv. කායේන වාචා චිත්තේන පාඨය ය.

4) "ඇඳුමට වැඩි වියදම් නොකරන්නේ..." යන පද්‍යය ඇතුළත් කෘතිය නම්,
   i. බුදුගුණ අලංකාරය යි.
   ii. ලෝවැඩ සඟරාව යි.
   iii. ගුත්තිල කාව්‍යය යි.
   iv. සිරිත් මල්දම යි.

5) කරණීය මෙත්ත සූත්‍රය තුළ ඇතුළත් වන්නේ,
   i. බුදු ගුණ ය.
   ii. මෙත් වඩන්නෙකු තුළ තිබිය යුතු ගුණ ය.
   iii. මංගල කරුණු ය.
   iv. තුන් බිය දුරු කිරීමේ ගුණ ය.



LIVEWORKSHEETS

- **6 සිට 10 දක්වා ප්‍රශ්නවලට අදාළ වාක්‍ය කියවා බලා නිවැරදි පිළිතුර හිස්තැන මත ලියන්න.**

6) බුදු සසුනේ අග්‍ර දායිකාව වන්නේ.........................................................................................යි.
(සුජාතා සිටු දේවිය / විශාඛා සිටු දේවිය / කිසා ගෝතමිය)

7) ධම්ම පදය අයත් වන නිකාය..................................................................................නිකාය යි.
(ඛුද්දක / අංගුත්තර / සංයුක්ත)

8) ගිහියාගේ නිත්‍ය ශීලය වන්නේ..............................................................................................ය.
(පන්සිල් / අටසිල් /ආජීව අෂ්ටමක සීලය)

9) සිගාලෝවාද සූත්‍රයේ ගුරුවරුන්ව උපමා කර ඇත්තේ...........................................දිශාවට ය.
(උතුරු / නැගෙනහිර / දකුණු)

10) බුද්ධ කාරක ධර්ම යනුවෙන් හඳුන්වන්නේ..........................................................................ය.
( දස පාරමිතා / චතුරාර්ය සත්‍යය /ආර්ය අෂ්ටාංගික මාර්ගය)

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල "අ" කොටසට අදාළ පිළිතුර "ආ"කොටසින් තෝරා එහි අංකය තිත් ඉර මත ලියන්න.**

| "අ" කොටස | "ආ" කොටස |
| --- | --- |
| 11) ඉවසීම ප්‍රගුණ කළ හිමිනමකි. | (...........) 1. පළමු දේවාචික උපාසකවරු ය. |
| 12) අග්‍ර ශිෂ්‍ය දානය, | (...........) 2. අන්‍යොන්‍ය උපකාරය, සහයෝගය යි. |
| 13) මැනවින් ඉගැන්වීම. | (...........) 3. පුණ්ණ තෙරණුවන් |
| 14) සහජීවනය යනු, | (...........) 4. අලුත් බත් සකසා පූජා කිරීම ය. |
| 15) තපස්සු භල්ලුක | (...........) 5. ගුරුවරයාගේ යුතුකමකි. |

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන තුළින් තෝරා නිවැරදි පිළිතුර තිත් ඉර මත ලියන්න.**

16) අකුසලයෙන් වෙන්වීම.............................................................................. ලෙස හඳුන්වයි.

17) පිසුණාවාචා වේරමණී යන ශික්ෂා පදය.............................. වැළකීම යන අදහස ගෙන දෙයි.

18) මැනවින් හික්මවීම.......................................................................විසින් ඉටුකරන යුතුකමකි.

19) ඉවසීමෙන් ලැබෙන්නේ.........................................................................................................ය.

20) සිංහලයන් ගේ ආගන්තුක සත්කාරය පිළිබඳ .................................................තම ප්‍රශංසාව පළකර ඇත.
(රොබට් නොක්ස් /ගුරුවරු /සැනසීම /විරතිය / කේලාම් කීමෙන් /ශිෂ්‍යයින්)



LIVEWORKSHEETS